## සංක්ෂිප්තය

පසු අස්වනු තාක්ෂණ ආයතනය මගින් දියත් කල සහල් සැකසුම් ගම්මාන වැඩසටහන ඇගයීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ විය. අනෙකුත් විශේෂිත අරමුණු වූයේ, පුහුණු වැඩසටහන්වල ඵලදායීතාවය ඇගයීමත්, ව්‍යාපෘතිය හා බැඳුණු ආයතනික සබඳතා අධ්‍යයනය කිරීමත්, සහල් සැකසුම්කරුවන්ගේ ආදායම් හා වියදම් නිමානය කිරීමත්, ව්‍යාපෘතියේ තිරසරභාවය හා බැඳුණු සාධක විශ්ලේෂණය කරමින් එම වැඩසටහන සාර්ථකව පවත්වා ගෙන යාම සඳහා සුදුසු යෝජනා ඉදිරිපත් කිරීමත් ය.

මෙම අධ්‍යයනයේ දත්ත රැස් කිරීම සඳහා සහල් සැකසුම් ගම්මාන ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන දිස්ත්‍රික්ක නවය අතුරින් අහඹු ලෙස දිස්ත්‍රික්ක හතරක් තෝරා ගන්නා ලද අතර එම දිස්ත්‍රික්කයන් හි පවතින සියලුම සහල් සැකසුම් ගම්මාන වලින් 50%ක් නියෝජනය වන ලෙස ගම්මාන 67ක් තෝරා ගන්නා ලදී. එක් කර්මාන්තකරුවෙක් නියැදි ඒකකයක් ලෙස සලකා තෝරා ගත් ගම්මානවල කර්මාන්තකරුවන්ගෙන් 15%ක නියැදියක් තෝරා ගන්නා ලදී. මේ අනුව, අනුරාධපුර දිස්ත්‍රික්කයේ කර්මාන්තකරුවන් 184ක් ද, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ 81ක් ද, කුරුණෑගල දිස්ත්‍රික්කයේ 95ක් සහ පුත්තලම දිස්ත්‍රික්කයේ 9ක් ලෙස සම්පූර්ණ නියැදිය 369ක් විය.

අධ්‍යයනයේ සොයා ගැනීම්වලට අනුව, පසු අස්වනු තාක්ෂණ ආයතනය මගින් හඳුන්වා දෙන ලද ගුණාත්මක සහල් සැකසීමේ තාක්ෂණය පිළිබඳ පුහුණුලාභීන් අතරින් අහඹු ලෙස තෝරා ගත් 369ක නියැදියෙන් 41%ක් පුහුණුලාභීන් පාරිභෝජනය සඳහා පමණක් ද, 47% පුහුණුලාභී හු පාරිභෝජනය හැරුණු කොට අලෙවිය සඳහා ද සහල් සැකසීමේ නියැලෙමින් සිටිය හ. ඒ අනුව, ග්‍රාමීය මට්ටමේ දී ගුණාත්මක සහල් නිෂ්පාදනය හා පාරිභෝජනය ඉහළ නැංවීම සඳහාත්, ඒ ආශ්‍රිත ව්‍යවසායකයන් බිහි කිරීම සඳහාත් පසු අස්වනු තාක්ෂණ ආයතනය ලබා දුන් පුහුණුව ඵලදායී ප්‍රයත්නයක් බව සඳහන් කළ හැකි ය.

නියැදියේ බහුතරය එනම් 82% (302) කාන්තාවන් ය. ඉන් 48%ක් ම (145) ගුණාත්මක සහල් සැකසුම, පාරිභෝජනය හා අලෙවිය යන අරමුණු දෙක උදෙසා පමණක් සිදු කරනු ලබයි. ඉන් 59% (86) කගේ ම ප්‍රධාන ආදායම් මාර්ගය සහල් සැකසීම වේ. මේ අනුව, ග්‍රාමීය කුටුම්භවල කාන්තාවන් තමන්ට සුදුසු ස්වයංරැකියාවක් ලෙස සහල් සැකසීම තෝරා ගෙන ඇත. ඔවුන් ගෘහස්ථ කටයුතු වල නියැලෙන අතර අමතර ආදායමක් ලබා ගැනීම සඳහා උනන්දු වන කාන්තාවන්ට මෙය කදිම ආදායම් මාර්ගයකි. එබැවින්, මෙම කර්මාන්තය සඳහා පිරිමි පාර්ශවයේ වැඩි යොමුවීමක් දක්නට නො ලැබෙන නමුත් සමස්ත නියැදියෙන් 1%ක් පමණ සහල් සැකසුම් කර්මාන්තය තම ප්‍රධාන ආදායම් මාර්ගය ලෙස තෝරා ගෙන ඇත.

සහල් සැකසුම් ගම්මාන සංකල්පය අනුව, මෙම වැඩසටහන දියත් කිරීම නිසා එක් ගමක් තුළ සහල් සැකසුම්කරුවන් රාශියක් බිහිවීමත්, ඔවුනොවුන්ට මහා පරිමාන සහල් සැකසුම්කරුවන් සමඟ තරඟ කිරීමට නො හැකිවීමත් හේතුවෙන් තම නිෂ්පාදන අලෙවි කිරීමට නිශ්චිත වෙළෙඳපොලක් නිර්මාණය වී නැත. ඒ අනුව, වාණිජ මට්ටමේ ව්‍යාවසායකයන් බිහිවීම පුහුණුලාභීන්ගෙන් 15%කට පමණ සීමා වී තිබේ. එබැවින්, වැඩසටහනෙන් අපේක්ෂිත පරිදි සහල් සැකසුම් ගම්මාන බිහි කිරීමේ ප්‍රයත්නය එතරම් සාර්ථකත්වයක් පෙන්වා නැත.

ගුණාත්මක සහල් නිෂ්පාදන තාක්ෂණය ප්‍රචාරණය වීමත්, එමගින් ග්‍රාමීය මට්ටමේ ගුණාත්මක සහල් නිපදවීම හා ග්‍රාමීය ජනතාව ඒවා පාරිභෝජනයට පෙළඹීමත් මෙම වැඩසටහනේ ධනාත්මක ප්‍රතිඵල වේ. සහල් සැකසුම් ගම්මාන ක්‍රමයේ ප්‍රගතිය දෙආකාරයකින් විග්‍රහ කළ හැකි ය. යැපුම් මට්ටමේ දී ගුණාත්මක සහල් පාරිභෝජනය දිරිගැන්වීම සඳහා ගුණාත්මක සහල් නිපදවීමේ තාක්ෂණය ප්‍රචලිත කිරීම හා වාණිජ මට්ටමේ දී සහල් සැකසුම් කර්මාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම එම දෙ ආකාරයයි.

ගුණාත්මක තත්ත්වයේ සහල් පාරිභෝජනය දිරි ගැන්වීම සඳහා මෙම තාක්ෂණය දිවයින පුරා ව්‍යාප්ත කළ යුතු අතර ඒ සඳහා ගුණාත්මක සහල් සැකසුම් ක්‍රමය පිළිබඳව කෘෂි ව්‍යාප්ති නිලධාරීන් හරහා ගම් මට්ටම දක්වා දැනුවත් කොට ග්‍රාමීය සංවිධානවල ඉල්ලුම මත පදනම් වෙමින් කණ්ඩායම් ප්‍රවේශයක් ඔස්සේ පුහුණු වැඩසටහන් දියත් කළ යුතු ය.

ගුණාත්මක සහල් සැකසීම වාණිජ මට්ටමේ කර්මාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා පුද්ගල ප්‍රවේශයක් අනුගමනය කළ යුතු ය. ඒ සඳහා විභවතා ඇති කර්මාන්තකරුවන් හඳුනා ගැනීමේ දී ව්‍යවසායකත්ව කුසලතා සහිත සහල් සැකසීම කර්මාන්තයක් වශයෙන් පවත්වා ගෙන යාමට කැමැත්ත හා කැපවීම ඇති, ප්‍රාග්ධනය සපයා ගත හැකි පුද්ගලයන් තෝරා ගත යුතු ය. ඔවුන් මෙම කර්මාන්තය වෙත යොමු කිරීම හා පසු විපරම් කොට ඔවුන් මුහුණපාන ගැටලු නිරාකරණය කිරීම සඳහා පියවර ගැනීම කළ යුතු ය. ගුණාත්මක සහල් නිෂ්පාදන කර්මාන්තයේ අඛණ්ඩ වර්ධනය උදෙසා මෙන් ම ගුණාත්මක සහල් පාරිභෝජනය ජනප්‍රිය කරවීම සඳහා රාජ්‍ය ප්‍රචාරක වැඩසටහන්වල දී මෙම තාක්ෂණය ප්‍රචාරණය කිරීමට පියවර ගැනීම වැදගත් වේ.